www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊ නායකයන් ඝාතනය කරයි

## Sri Lankan army slaughters LTTE leaders

**කේ රත්නායක විසිනි.**
2009 මැයි 19

එල්ටීටීඊ දේශසීමාවේ අන්තිම කුඩා බිම් කොටස අල්ලා ගැනීමේ සටනේ දී එහි නායක වී ප්‍රභාකරන් ඇතුලු බෙදුම්වාදී දෙමල විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) නායකයන් හමුදාව විසින් ඝාතනය කල බව ශ්‍රී ලංකා රජයේ රූපවාහිනිය ඊයේ නිවේදනය කලේ ය. මිය ගිය සෙසු නායකයකයන් අතර එල්ටීටීඊ බුද්ධි අංශයේ නායක පොට්ටු අම්මාන්, බී. නඩේසන් සහ එස්. පුලිදේවන් වූහ.

සඳුදා අලුයම ඇති වූ සටනේ දී ප්‍රභාකරන් ඝාතනය කරනු ලැබූ බවත් අන්තිම සටනේදී තවත් එල්ටීටීඊ සටන්කරුවන් 250ක් මිය ගිය බවත් මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර නිවේදනය කලේ ය. එල්ටීටීඊ සටන්කරුවන්ගෙන් පිරුන බසයක් කැටුව ගිය සන්නාහ ලෝහ තහඩුවලින් ආවරනය කල වෑන් රථයකින් පලායාමට එල්ටීටීඊ නායකයා උත්සාහ කල බව තවත් හමුදා මූලාශ්‍රයක් ඇසෝසියේටඩ් ප්‍රෙස් ප්‍රවෘත්ති සේවයට ප්‍රකාශ කලේ ය. වාර්තා වන ආකාරයට තද බල ලෙස පිලිස්සී ඇති ප්‍රභාකරන්ගේ මෘත ශරීරය හඳුනා ගැනීම සඳහා ඩීඑන්ඒ පරීක්ෂනයක් පැවැත්වීමට නියමිත ය.

හමුදාව විසින් එල්ටීටීඊ නායකයන් "හිතාමතාම සමූලඝාතනය" කිරීම පිලිබඳ චෝදනා කරන එල්ටීටීඊ හිතවාදී ටැමිල් නෙට් වෙබ් අඩවිය හමුදාවේ වාර්තාවට අභියෝග කර තිබේ. තව දුරටත් සිවිල් ජනයාගේ ජීවිත විනාශවීම වැලැක්වීම සඳහා තම "වෙඩි ප්‍රහාර නතර කරන" බවට එල්ටීටීඊය ඉරිදා නිල ප්‍රකාශයක් නිකුත් කලේ ය. ටැමිල්නෙට් වෙබ් අඩවියට අනුව ප්‍රදේශයෙන් ඉවත්වීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය (අයිසීආර්සී) විසින් එල්ටීටීඊ දේශපාලන අංශ නායක බී නඩේසන්ට බල කර තිබුනි. පැය කිහිපයකට පසු ප්‍රභාකරන්, නඩේසන් සහ සෙසු නායකයන් ඝාතනය කරනු ලැබීය.

ශ්‍රී ලංකා ආන්ඩුව සහ මිලිටරිය විසින් මාධ්‍යවේදීන්ට, ආධාර සේවකයන්ට සහ සෙසු නිරීක්ෂකයන්ට යුද කලාපයට ඇතුලුවීම තහනම් කර ඇති නිසා සිදුවන දේ පිලිබඳව ස්වාධීන වාර්තාවක් නැත. එහෙත්, ආන්ඩුව විසින් යුද උන්මාදයේ වාතාවරනයක් නිර්මානය කර ඇති තතු තුල, එහි යුද අපරාධ වහංගු කිරීමේ කොටසක් ලෙස ඉතිරිව සිටින එල්ටීටීඊ නායකයන් සහ එහි සටන්කරුවන් මත හමුදාව විසින් දුෂ්ට ප්‍රහාරයක් එල්ල කල බව ප්‍රතික්ෂේප කල නොහැකි ය. නිසැකව ම, ශ්‍රී ලංකා හමුදාවේ වෙබ් අඩවියේ පල වූ මෑතම පුවෘත්තිය නිශ්චිත පිලිකුල් සහගත තෘප්තිමත්වීමක් අඩංගු කර ගෙන තිබේ. "තව තවත් ප්‍රධාන කොටි නායකයන් සුනු විසුනු වූ බව තහවුරු වෙයි" යන ශීර්ෂ පාඨය යටතේ පල වූ ලිපියක "ඔවුන්ගේ ඉරනමෙන් පලායාමට උත්සාහ කල තවත් ජ්‍යෙෂ්ට ත්‍රස්තවාදීන් 11 ගේ මරනය තහවුරු වී ඇති" බව හමුදාව ප්‍රකාශ කලේ ය. තවත් "ප්‍රධාන එල්ටීටීඊ ත්‍රස්තවාදීන් දෙන්නෙක් සහ නේසාමි මරා දමයි." යන ශීර්ෂ පාඨය යටතේ පල වූ වෙනත් ප්‍රවෘතියකින් තවත් "ජ්‍යෙෂ්ඨ ත්‍රස්තවාදීන්" දෙන්නෙක් මරා දැමීම නිවේදනය කලේ ය.

එල්ටීටීඊයේ පරාජයෙන් පසුව, කෘතිම විජයග්‍රාහී වාතාවරනයක් නිර්මානය කිරීම සඳහා කොලඹ දේශපාලන සංස්ථාපිතය එකට එකතු වී ඇත. ප්‍රධාන විරුද්ධ පක්ෂ - එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුන ජයග්‍රහනය ගැන හමුදාවට සහ ආන්ඩුවට සුබපතා තිබේ. "ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊය හමුදාමය වශයෙන් පරාජය කර දශක තුනක ත්‍රස්තවාදයෙන් රට නිදහස් කර ගෙන ඇති" බව හමුදා කොමාන්ඩර් ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා රජයේ රූපවාහිනිය මගින් නිවේදනය කලේ ය.

එහෙත්, 26 වසරක ගැටුම සිංහල පාලක පන්තියේ දේශපාලන අධිපතිත්වය තහවුරු කිරීමේ සහ කම්කරු පන්තිය බෙදීමේ වාර්ගික යුද්ධයක් මිස "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" නොවේ. එල්ටීටීඊය විසින් අල්ලා ගෙන සිටි ඉතිරිව පැවති වර්ග කිලෝමීටර් කිහිපය මත පසුගිය සතියේ අවසාන ප්‍රහාරය එල්ල කලේ සටනට මැදිව සිටි දසදහස් සංඛ්‍යාත දෙමල සිවිල් ජනයාගේ ජීවිත කෙරෙහි සාපරාධී නොතැකීමක් සහිතව ය. හමුදාව සැලකිලිමත් වූ තාක් දුරට සියලුම දෙමල ජනයා ශත්‍රැ සතුරෝය.

පසුගිය බ්‍රහස්පතින්දා සිට සටනේ අවසන් තෙදින තුල දස දහස් ගනනක් මිනිස්සු ප්‍රදේශයෙන් පලා ගියහ. පලායාමට උත්සාහ කරමින් ඔවුන්ගේ බඩුබාහිරාදිය සහිත කුඩා පොට්ටනි හිස තබාගත් අනාරක්ෂිත ජනයා එකට රැස්වී සිටි ආකාරය ආරක්ෂක අමාත්‍යංශයේ පින්තූරවල දක්නට ලැබුනි. විනාශභාග් වූ ගොඩනැගිලි, බෝම්බ ප්‍රහාරවලින් පුපුරුවා හල වාහන සහ ගිනි ගෙන දැවෙන ආයුධවල පින්තූර සහිත වීඩියෝපට දැවැන්ත විනාශයක දර්ශන එළිදරව් කලේ ය.

දේශපාලන පලිගැනීමේ ක්‍රියාවක් ලෙස එල්ටීටීඊයේ කුඩා භූමි ප්‍රදේශය තුල තාවකාලික රෝහලක් පවත්වා ගෙන ගිය ආන්ඩුවේ වෛද්‍යවරු තිදෙනා - තන්ගමුත සත්‍යමූර්ති, තුරෙයිරාජා වර්ධරාජා, සහ වී. සන්මුගරාජා අත් අඩංගුවට ගෙන පොලීසියට භාර දී ඇත. සාවද්‍ය තොරතුරු සැපයීම සමබන්ධයෙන් ඔවුන්ට විරුද්ධව චෝදනා ගොනු කිරීම සඳහා පොලීසිය වෛද්‍යවරුන්ගෙන් ප්‍රශ්න කරමින් සිටින බව සෞඛ්‍ය අමාත්‍යංශයේ ප්‍රකාශකයෙක් *ඇසෝසියේටඩ් ප්‍රවෘත්ති* සේවයට පැවසුවේ ය.

කිසිදු වගවිභායකින් තොරව ෂෙල්වෙඩි ප්‍රහාර එල්ල කිරීම මගින් මරනයට පත්වූ සියගනනක් පිලිබඳව තොරතුරු සැපයීම සම්බන්ධයෙන් කොලඹ ආන්ඩුව සහ මාධ්‍යය සති ගනනාවක් පුරා වෛද්‍යවරුන්ට රූදුරු ලෙස දෝශාරෝපනය කලහ. ආන්ඩුවේ ප්‍රකාශකයා මුල දී මෙම වෛද්‍යවරු සිටින බව පවා ප්‍රතික්ෂේප කල අතර අනතුරුව ඔවුන් එල්ටීටීඊයේ ප්‍රචාරක වැඩ පිලිවෙල වෙනුවෙන් කතා කරන බවට චෝදනා කලේ ය.

එහෙත් වෛද්‍යවරු නිවැරදි තොරතුරු සැපයූ බව එක්සත් ජාතීන්ගේ සංවිධානය අවධාරනය කලේ ය. ඔවුන්ට හොඳින් සලකන ලෙස එක්සත් ජාතීන්ගේ සංවනිධානයේ මානුෂීය කටයුතු ප්‍රධානී ජෝන් හෝම්ස් ඊයේ ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. පසුගිය සතිවල සහ මාසවල පරම වසයෙන්ම වීරත්වයෙන් යුතුව ක්‍රියා කල මේ මිනිස්සු හැම අතකින්ම ප්‍රශස්ත සහ සැලකිලි ලැබීමට සුදුසු ය. ඊටත් වඩා වෙනස් කිසිවක් නොවෙයි" ඔහු කීවේ ය.

ආන්ඩුව සහ මිලිටරිය ඔවුන්ගේ යුද අපරාධ පිලිබඳ සියලුම සාක්ෂි යටපත් කිරීමට පැහැදිලිව ම අදහස් කර ගෙන ඇත. මානව හිමිකම් පිලිබඳ ඇමති මහින්ද සමරසිංහ නරුම ලෙස ඊයේ මෙසේ ප්‍රකාශ කලේ ය: "සමහර මිනිස්සු බිය වූ ආකාරයට එහි ලේ විලක් නිර්මානය වූයේ නැත. සියලු දෙනාම ආරක්ෂා සහිතව එලියට පැමිනි අතර ආන්ඩුව විසින් ඔවුන්ව රැක බලාගන්නවා."

ඇත්ත වශයෙන්ම තත්වය එහි ප්‍රතිවිරුද්ධයයි. හෙලදරව්වූ එක්සත් ජාතීන්ගේ වාර්තාවකට අනුව ජනවාරි 20 සිට මැයි 7 දක්වා 7,000ක් සිවිල් ජනයා මරනයට පත් වී 16,700ක් තුවාල ලබා ඇත. ඊට පසු සතියේ 1,000ක් මරනයට පත් වූහ. ඉන් බොහෝ දෙනා මිය ගියේ ෂෙල් වෙඩි ප්‍රහාර වලිනි. පසුගිය දින හතරේ තවත් නොදන්නා සංඛ්‍යාවක් මරනයට පත් පත්විය. බොහෝ මරන සිදුවූයේ ආන්ඩුව විසින් පාලිත ඊනියා යුද මුක්ත කලාපය තුල ය.

පසුගිය සති අන්තයේ එල්ටීටීඊ පාලිත ප්‍රදේශයේ තත්වය විස්තර කරමින් යුනිසෙෆ් සංවිධානයේ ප්‍රකාශක ජේම්ස් එල්ඩර් මෙසේ පැවසුවේ ය. "ඒ වෙරල තීරුවේ මේ දැන් ලෝකයේ නරකම ස්ථානය පිහිටා තිබෙන බව සිතාගැනීම අසීරුයි. එය ලේ ගංගාවකි. එය විනාශකාරී තත්වයක්. සිවිල් ජනයා කෙරෙහි සම්පූර්න නොතැකීමක් අප දකිනවා.'' සිරවී සිටින සිවිල් ජනයා "වගවිභාගයකින් තොරව හැම පැත්තෙන් ම එල්ල කෙරෙනවෙඩි තැබීම්වලට" මුහුන දී සිටි බව ඔහු කිවේය.

එල්ඩර් තව දුරටත් විස්තර කලේ; ''සති තුනකට පෙර මුලින්ම පිටවී ආ කන්ඩායමේ තත්වය දෙස බලනවිට මන්දපෝෂනයෙන් පෙලෙන ලමයින් සහ ගැහැනුන් ද වෙඩි වැදීමෙන් සහ බෝම්බ පිපිරීම්වලින් තුවාල සිදු වූ මිනිසුන් ද හිටියා. මේ අය නිසි ආහාරයක් නැතිව දරුනු කොන්දේසි යටතේ තවත් සති තුනක් ගත කර තියෙනවා. සිදුවෙන්න යන්නේ මහා භයංකර දෙයක්.''

යුද මුක්ත කලාපයට ඇතුල්වීම සඳහා දින නවයක් තිස්සේ අසාර්ථක උත්සාහයක යෙදුන බව ඊයේ ප්‍රකාශ කල රතු කුරුස සංවිධානය තුවාලකරුවන්ට ප්‍රතිකාර කර නොතිබීම පිලිබඳ කනස්සල්ල පලකලේ ය. ඇවිදීමට හැකි අය පමනක් ප්‍රදේශයෙන් පිටතට පැමින තිබේ. ඉරිදා උදේ සිට එහි සිටි දේශීය කාර්ය මන්ඩලයේ 25ක් සමග සම්බන්ධතා බිඳී ගිය බව රතු කුරුස සංවිධානය කීවේ ය.

''ජාත්‍යන්තර නීතිය යටතේ සටන් නොකල සහ තවදුරටත් සටන් නොකරන සියලු දෙනාගේ ජීවිත ආරක්ෂා කල යුතුයි. තුවාල ලැබූ සහ රෝගී මිනිසුන් ගෙන ගොස් වහාම ප්‍රතිකාර කල යුතුයි. රැඳවියන්ට මානුෂික ලෙස සැලකිය යුතුයි. මානුෂික ආධාර අවශ්‍ය අයට සතියකටත් වඩා වැඩි කාලයක් තුල ඒවා ලැබී නැති නිසා මෙය ඉතාම හදිස්සි කාරනයක්'' යයි රතුකුරුස සංවිධානයේ මෙහෙයුම් අධ්‍යක්ෂ පියරේ ක්‍රහෙන්බුල් ප්‍රකාශ කලේ ය. යුද මුක්ත කලාපයෙන් එලියට ආ යුතු සංඛ්‍යාව 65,000 බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානයේ (යූඑන්එච්ආර්සී) ප්‍රකාශයක ඊයේ සඳහන් කලේය. පසුගිය මාස කිහිපය තුල හමුදාව විසින් පාලිත රඳවා ගැනීමේ කඳවුරුවලට ගාල් කල අභ්‍යන්තරව අවතැන් ව සිටින සංඛ්‍යාව අවම වශයෙන් දැන් 265,000කි.

''දැනට මත් අභ්‍යන්තරව අවතැන් වූ ජනයාගෙන් පිරී ගිය කඳවුරු මතට අලුතින් පැමිනෙන ජනයා නිසා තවත් බරක් පැටවෙන බව'' එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානය අනතුරු ඇඟවීය.

ප්‍රමානවත් තරම් ආහාර සහ සෙසු මූලික පහසුකම් නැති මෙම මධ්‍යස්ථානවලට ''තමන්ට යාමට ඇති ඉඩකඩ විශාල වශයෙන්'' හමුදාව විසින් අහුරා ඇත''යි මානව හිමිකම් සංවිධානය පැමිනිලි කලේ ය. කඳවුරු 42 කොන්දේසි වැඩි දියුනු කිරීම සඳහා නව නිවහන් ගොඩ නැගීම සඳහා වැඩිපුර ඉඩම් වෙන්කරන ලෙස එම සංවිධානය ඉල්ලා සිටියේ ය. මෙම රැඳවුම් මධ්‍යස්ථාන දැලිපිහිතල කම්බිවලින් වටකොට හමුදා රැකවල් යොදා ඇත. රැඳවියන්ට ඉන් පිටව යාමට අවසර ලැබෙන්නේ නැත. රෝගී වූ සහ තුවාල වූ අය රෝහල්වලට පොදිගැසී සිටියත් ඔවුන්ට ප්‍රතිකාර කර නැත.

දෙමල සිවිල් ජනයාගේ තත්වය පිලිබඳව අවධානය යොමු කරමින් ප්‍රධාන බලයන් විසින් කුහක ප්‍රකාශ ගනනාවක් නිකුත් කිරීමට ශ්‍රී ලංකාව තුල මානුෂික විනාශය හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ සිවිල් ජන ඝාතනයන් පිලිබඳව ස්වාධීන පරීක්ෂනයක් සහ ගැටුම අවසන් කිරීම සඳහා ''දේශපාලන විසඳුමක්'' යුරෝපීය සංගමයේ විදේශ ඇමතිවරු ඊයේ ඉල්ලා සිටියහ.

''සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ අයිතීන් වැඩි දියුනු කරන සහ ආරක්ෂා කරන දේශපාලන සැලැස්මක් නිර්මානය කිරීමට දෙමල, සිංහල සහ සෙසු ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ කර ගැනීමට ආන්ඩුව (කොලඹ) පියවර ගත යුතු'' යයි එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව ද ඉල්ලා සිටියේ ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ඉල්ලා ඇති ඩොලර් බිලියන 1.9 නය මුදල අත්හිටුවීමට වොෂින්ටනය අදහස් කර තිබේ ද නැති ද ප්‍රකාශ කිරීම ප්‍රකාශක අයන් කෙලී ප්‍රතික්ෂේප කලේ ය. ඔවුන්ගේ ඉල්ලීම් පිලිගැනීම සඳහා ජනාධිපති රාජපක්ෂට පීඩනය යෙදීමේ ලීවරයක් ලෙස එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය විසින් නය මුදල යොදා ගෙන තිබේ.

"දේශපාලන විසඳුමක්" පිලිබඳ මෙම ආයාචනයන් දිග් ගැසුන යුද්ධය ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්'' නොව බලයට පත් කොලඹ ආන්ඩුව විසින් දශක ගනනාවක් පුරා දෙමල ජනයාට එරෙහිව පවත්වා ගෙන ගිය වෙනස්කම් කිරීමේ නිෂ්පාදිතයක් බව නිහඬව පිලිගැනීමකි. සටන් බලකායක් ලෙස එල්ටීටීඊය පරාජය කර ඇති නමුදු අධස්ථයෙහි, පවතින එකදු දේශපාලන ප්‍රශ්නයක් වත් විසඳී නැති බව එක්සත් ජනපදය සහ යුරෝපීය සංගමය දන්නේ ය. වාර්ගික ආතතිය ශ්‍රී ලංකාවේත් ඉන්දියාව තුලත් දේශපාලන අස්ථාවරත්වයකට තුඩුදෙනු ඇතැයි ඔවුහු බියට පත්ව සිටිති.

යුද අපරාධ සම්බන්ධව වගකිවයුතු ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු ලුහුබැඳයාමේ කිසිදු අදහසක් එක්සත් ජනපදයට හෝ යුරෝපා සංගමයට නැත. 2002 සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් 2006 මැද රාජපක්ෂ යුද්ධය යලි ආරම්භ කිරීම සහ එහි "ත්‍රස්තවාදයට එරෙහි" මිනීමරු යුද්ධයේ දී හමුදාවට හිතුමතයේ ක්‍රියා කිරීමට ඉඩ දීම ගැන මේ ආන්ඩු පසුගිය වසර දෙක හමාර පුරාම නිහඬව සිටියහ. දැන් ප්‍රමාදවී දෙමල සිවිල් ජනයා පිලිබඳ අවධානය යොමු කර ඇත්නම් එහි තේරුම රාජපක්ෂ තන්ත්‍රයට පීඩනය යෙදීම සහ පශ්චාත්-යුද්ධ ශ්‍රී ලංකාව තුල එක්සත් ජනපදයේ සහ යුරෝපීය සංගමයේ උත්සුකතාවයන් ඉස්මත්තට ගැනීම ය.

රාජපක්ෂ ආන්ඩුව රටේ ගැඹුරුවන ආර්ථික අර්බුදයට මුහුන දෙන තතු තුල මෙම ''ජයග්‍රහනය'' කම්කරු පන්තියේ - සිංහල, දෙමල මුස්ලිම් සියලු දෙනාගේ ම - සමාජ තත්වයට නව ප්‍රහාරයක් එල්ල කිරීමේ ආරම්භයක් බව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය අනතුරු අඟවයි. එල්ටීටීඊයට සහ එහි දෙමල බෙදුම්වාදී වාර්ගික ක්‍රියාමාර්ගයට සසප කිසිදු දේශපාලන සහයෝගයක් නොදෙයි. එහෙත් මෑත සතිවල දී දෙමල සිවිල් ජනයා ඇතුලුව එල්ටීටීඊ නායකයන් සහ එහි සටන්කරුවන්ට එරෙහි නිර්දය මිලිටරි ඝාතනය ආන්ඩුවේ ආර්ථික ප්‍රහාරවලට එරෙහිව වැඩ කරන ජනයාගෙන් එල්ල වන කවර හෝ විරුද්ධත්වයක් සමඟ ගනුදෙනු කිරීමට යොදාගනු ලැබිය හැකි ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් පිලිබඳ තියුනු අවවාදයකි.

© www.wsws.org